# මාතර යටියන සමරවික්‍රම පරම්පරාවේ කැඩුම් බිඳුම් හා සර්වාංග වෙදකම්

පාරම්පරික වෛද්‍ය ඩී. සමරවික්‍රම

මාතර යටියන, වසර විස්සකට පමණ ඉතිහාසයකට හිමිකම් කියන සමරවික්‍රම වෙද පරපුර ගාල්ල දෙවට, සරෙන්තු කඩේ හන්දිය ආදී ප්‍රදේශ ආශ්‍රිත ව ගාල්ල මාතර යන දිස්ත්‍රික් දෙකෙහි ම රෝගීන් විශාල සංඛ්‍යාවකට සේවය කරමින් විශිෂ්ට නමක් හිමිකර ගත් පාරම්පරික වෙද පරපුරකි. පියාගෙන් අනතුරුව එම වෙදකම ඉදිරියට ප්‍රගුණ කරමින් දැනට ගාල්ල දිසානායක ආයුර්වේද රෝහලේ පාරම්පරික කැඩුම් බිඳුම් විශේෂඥ වෛද්‍යවරිය වශයෙන් කටයුතු කරමින් මසකට රෝගීන් 500 ක් පමණ ප්‍රමාණයකට ප්‍රතිකාර කරනු ලබයි.

භග්න රෝගියෙකු පරීක්ෂා කිරීමේදී මාගේ පාරම්පරික පළපුරුද්ද අනුව ආඝාතය පිළිබඳ හඳුනා ගැනීම සිදුකර මූලික ව ඇතිවන ප්‍රදාහ ලක්ෂණ වලට පළමුව පාරම්පරික විශේෂිත ප්‍රතිකාර මඟින් සතියක් තුළ එම ලක්ෂණ සඳහා ප්‍රතිකාර කර අනතුරුව දෙවන සතියේ භග්න සන්ධානය සඳහා පැයේ ප්‍රතිකාරය සිදු කරයි.

**මූලික අවස්ථාවට**

නික කොළ ආදී ඖෂධ ද්‍රව්‍ය වලින් සාදා ගන්නා නික කොළ පත්තුව භාවිත කරයි. පැයේ ප්‍රතිකාරය ලෙස,

| | |
|---|---|
| බූ කැන්ද මුල | - බූ කැන්ද කොළ පොතු |
| කොටදිඹුලා කොළ පොතු | - අඟු කොළ |
| ගොනු කෑ කොළ | - හීන් අරත්ත |
| ගම්මිරිස් | - සුදුලූණු |
| අබ | - අමුකහ |
| ලුණු | |

මේවා සිහින් ව කොටා විනාඩියක් පමණ මලවා භග්නය සකස් කර එම ස්ථානයට තබා බැඳීම.

විනාඩි 20කට පමණ පසු ව රෝගියාට තොල කට වියළීම, දහඩිය දැමීම, ඇතැමුනට ක්ලාන්ත ස්වභාවය, හුලකින් අනින්නාක් බඳු තද ස්ථානික වේදනාව ආදී ලක්ෂණ ඇති වේ. පැයක් පමණ යන විට එම වේදනාවන් සම්පූර්ණයෙන් ම පහවී යයි. ඉන් අනතුරුව සියලු මැල්ලුම් ඉවත් කිරීම සිදු කරයි. එය ඉවත් කිරීමත් සමඟ එම ස්ථානය සාමාන්‍ය තත්වයට පත් වූ ලක්ෂණ දක්නට ලැබේ. එවිටම,

දිය නොමුසු මිටි පොල් කිරි, අමු කහ හා ලුණු මිශ්‍ර කර පරම්පරාවට ආවේණික මන්ත්‍රයකින් මතුරමින් එම ස්ථානය අභ්‍යංග කරයි. පසුව පරම්පරාවේ කැඩුම් බිඳුම් තෙල ආලේප කොට ඉහත සඳහන් කළ මැල්ලුම වේල් හයක් බැඳීම සිදු කරයි.

අනතුරුව දින 10ක් පමණ පැණි පත්තුව ආලේපය ද අනතුරුව එන සංකූලතා සඳහා (සන්ධි තද වීම, මාංස ක්ෂය ආදී) අවශ්‍ය ප්‍රතිකාර සිදු කරයි.

කුඩා සන්ධි සති 02 ක පමණ කාලයක දී ද, විශාල භග්න මාස 02 ක පමණ කාලයක දී ද සම්පූර්ණයෙන් සුව වේ.

කොඳු ඇට පෙළ ආශ්‍රිත ව ඇතිවන ආබාධ සඳහා ඒ ඒ පුද්ගලයා ගේ ප්‍රකෘතිය අනුව ශෝධන, ශමන හා තර්පණ ප්‍රතිකාර ක්‍රම අනුගමනය කරයි.

එසේම කොර සන්ධි සඳහා විශේෂිත ප්‍රතිකාර ක්‍රමද අප පරම්පරාව සතුව පවතී.